# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1626 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 26/12/2023<br>පැය 1100 |

## මාධ්‍ය නිවේදනය

**01. පිස්තෝල අවියක් සහ එම පතොරම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලස්ථාන කඳවුර.**

2023.12.25 වන දින උදෑසන කාලයේ දී **පොලිස් විශේෂ කාර්ය බලකා මුලස්ථාන කඳවුරේ** නිලධාරීන්ට ලද තොරතුරක් මත බඩල්ගම පොලිස් වසමේ අකරන්ගහ. බඩල්ගම ප්‍රදේශයේ නිවසක් පරික්ෂා කර විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල අවියක්, එම අවියට යොදන පතොරම් 75 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන අකරන්ගහ, බඩල්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බඩල්ගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - මුරුන්කන් පොලිස් වසම.**

2023.12.25 වන දින සවස් කාලයේ මුරුන්කන් පොලිස් වසමේ නානාට්ටාන් නගරයේ සිට සිලාවතුර දෙසට ඇති මර්ගයේ 15/1 දරණ බොක්කුව අසලදී සිලාවතුර දෙස සිට නානාට්ටාන් දෙසට ධාවනය කල යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට විසිවී කොන්ක්‍රීට් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු නානාට්ටාන් රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ අරිප්පු බටහිර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරින් බරපතල තුවාල ලැබූ පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා මන්නාරම රෝහලට මාරුකර යවා ඇත. මුරුන්ගන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**